# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2279/06 – 2022 මැයි 09 වැනි සඳුදා – 2022.05.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/K/2015/61.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 2265/36 දරන හා 2022.02.02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් පාදුක්ක, බටවල, අංක 13/2 හි පදිංචි චමිල් ප්‍රියන්ත සමරධීර මයා සහ අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, නාරාහේන්පිට, ඇල්විටිගල මාවත, අංක 354/2, ''නිපුනතා පියෙස'' 04 වන මහල හි පිහිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 03/2021 දරන හා 2021.12.24 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් චමිල් ප්‍රියන්ත සමරධීර මයා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 03/2021 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2023.02.02 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 මාර්තු මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පළමුවන උපලේඛනය**

''අ'' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

අංක 13/2, බටවල,
පාදුක්ක.
2022 පෙබරවාරි මස 24 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2022.02.02 දිනැති අංක 2265/36 දරන *ගැසට්* පත්‍රයේ පළකරන ලද්දාවූ ද චමිල් ප්‍රියන්ත සමරධීර සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය බැඳී සිටින්නා වූ ද 2021.12.24 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*පිටපත (අනෙක් පාර්ශවය)* ;

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

01. ප්‍රතික්ෂේප කරන පාර්ශවය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශවයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න.)

02. දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශවයක්, සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශවයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 05 - 0031

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.